# වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත වර්තමාන ප්‍රවණතා: රදාවඩුන්න ග්‍රාමසේවා වසම ඇසුරින්

ආර්. එම්. කළිඳු රත්නායක[1]

**සංක්ෂේපය**

ලෝකයේ එක් එක් ප්‍රදේශයන්ට ආවේනික වූ ප්‍රාදේශීය ආර්ථික කටයුතු දැකගත හැකි අතර ඒවා ගෝලීය, කලාපීය හා ප්‍රාදේශීය මට්ටමින් හඳුනා ගත හැකි වේ. කිසියම් ප්‍රදේශයක පවතින දේශගුණය, භූ විෂමතාව ආදී භූගෝලීය සාධක මෙන්ම වෙළෙඳපොල, මානව අවශ්‍යතා ආදී මානුෂ සාධකවල ප්‍රථිඵලයන් මත ප්‍රාදේශීය ආර්ථික කටයුතු බොහෝ විට ස්ථානගත වනු ලබයි. මෙම පර්යේෂණ ලිපිය මඟින් අධ්‍යයනයන කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ප්‍රාථමික ආර්ථික කටයුත්තක් ලෙස වේවැල් ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාමෙහි මෑත කාලීන ප්‍රවණතාවයයි. ඒ අනුව මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වන්නේ වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත වර්තමානයේ දැක ගත හැකි ප්‍රවණතා හඳුනා ගැනීමයි. එමෙන්ම පර්යේෂණයේ සෙසු අරමුණු ලෙස මෙම ආර්ථික කටයුත්ත ස්ථාන ගත වීමට බලපාන හේතු හඳුනා ගැනීමත්, මෙම ආර්ථික කටයුත්ත ආශ්‍රිතව වර්තමානයේ පවතින ගැටළු හඳුනා ගැනීමත් මූලික විය. සංස්කෘතික පරිසර විද්‍යාත්මක ප්‍රවේශයකින් සිදු කරන මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත භාවිතා කරනු ලැබිණි. එම දත්ත ක්ෂේත්‍ර නිරීක්ෂණ, ව්‍යුහගත හා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා, පොත්පත්, සඟරා හා අන්තර්ජාලයෙහි ප්‍රකාශිත ලිපි ලේඛන මඟින් රැස් කර ගන්නා ලදී. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී නියැදිය ලෙස තෝරා ගනු ලැබුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රදාවඩුන්න ග්‍රාමසේවා වසමයි. මෙම අධ්‍යයනය සඳහා මෙම ප්‍රදේශය තෝරා ගැනීමට හේතු වූයේ ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම පැහැදිලිවම හඳුනා ගත හැකි ප්‍රධානම කලාපයක් වීම නිසාවෙනි. අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය කිරීමේ දී කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් හා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම භාවිතා කළ අතර විශ්ලේෂණය කරන ලද දත්ත ප්‍රස්තාර, වගු හා සිතියම් ආදී මාධ්‍යයන්ගෙන් ඉදිරිපත්කොට ඇත. මෙම පර්යේෂණය අවසානයේ දී වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත මෑත කාලීන ප්‍රවණතා රැසක් හඳුනා ගැනීමට හැකිවිය. ඒ අනුව මෙම කර්මාන්තයට නූතන දායකත්වය ඉතා මඳ බව, වර්තමානය වන විට වේවැල් නිෂ්පාදන කර්මාන්තයේ නිෂ්පාදනයේ පසුබෑමේ ස්වභාවයක් දැකගත හැකි වීම, නිෂ්පාදන විවිධාංගීකරණය වීම හා ආදේශක අමුද්‍රව්‍ය වලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම යනාදිය ද වේවැල් නිෂ්පාදන කර්මාන්තය ස්ථාන ගත වීමට බලපෑ හේතු ලෙස පාරම්පරික නිෂ්පාදන හිමිකමක් පැවතීම හා භූමිය ලාභදායී වීම ද මෙම කර්මාන්තය ආශ්‍රිතව පවතින ගැටළු ලෙස අමුද්‍රව්‍ය හිඟය හා පුහුණු ශ්‍රමය හිඟ වීම යනාදියත් පර්යේෂණය සිදු කිරීමෙන් අනතුරුව හඳුනා ගැනීමට හැකි විය. අවසානයේදී අධ්‍යයනයේ දී හඳුනා ගනු ලැබූ ඇතැම් ගැටළු සඳහා තිරසර විසඳුම් හා යෝජනා ද ඉදිරිපත් කොට ඇත.

**මූඛ්‍ය පද:** *ආර්ථික භූගෝල විද්‍යාව, ප්‍රාදේශීය ආර්ථික කටයුතු, ප්‍රාථමික ආර්ථික කටයුතු, වේවැල් ආශ්‍රිත නිෂ්පාදන, වේවැල් කර්මාන්තය*

## 1.0 හැඳින්වීම

ශිෂ්ටාචාර ආරම්භයේ සිටම මිනිසා සිය අවශ්‍යතා සඳහා ශාක හා සතුන් ප්‍රයෝජනයට ගෙන ඇත. අතීතයේ දී මෙන්ම වර්තමානයේ දී ද ලොව පුරා විවිධ ප්‍රාථමික ආර්ථික කටයුතු ව්‍යාප්තව ඇත. ලෝකයේ සෑම දේශගුණ කලාපයකම මිනිසුන් එම දේශගුණයට

[1] භූගෝල විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sandeeprathnayaka@gmail.com

හා සම්පත් හිමිකම අනුව විවිධ ප්‍රාථමික ආර්ථික කටයුතුවල නිරතවනු දැකගත හැකිවේ. උදාහරණ ලෙස කුඹල් කර්මාන්තය, වෙස් මුහුණු කර්මාන්තය, පිත්තල කර්මාන්තය ආදිය පෙන්වා දිය හැකිය. මෙම පර්යේෂණ ලිපිය මඟින් අවධානය යොමු කොට ඇත්තේ වේවැල් නිෂ්පාදන හා ඒ ආශ්‍රිතව වර්තමානයේ දැකගත හැකි ප්‍රවණතාවයන් පිළිබඳවයි.

වේවැල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව අධ්‍යයනය කරන විට එහි ඉතිහාසය ඉතා ඈතට දිවයනු ලබයි. මහින්දාගමනයෙන් පසුව සිදු වූ දුමින්දාගමනයේ දී සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමඟ දහ අටක් වූ කුල සමඟ මෙරටට පැමිණි බව මහාවංශය සාක්ෂි දරනු ලබයි. එම කුල අතරින් ‘‘කුළු පොත්තන්’’ ලෙසින් නාමකරණය වී ඇත්තේ වේවැල් කර්මාන්තයේ නියුතු වූ පිරිසයි. රජුන්ගේ හා ප්‍රභූන්ගේ අවශ්‍යතා මුල් කාලීනව සපිරූ මොවුන් පසු කාලීනව මුළු මහත් ලංකාව පුරාව ව්‍යාප්ත වෙමින් ශ්‍රී ලංකාවාසී සියලු දෙනාගේ වේවැල් නිෂ්පාදන භාණ්ඩ අවශ්‍යතාවය සපුරන ලදී (ජයවර්ධන, 2015).

### 1.1 පර්යේෂණ ගැටලුව

ප්‍රාථමික ආර්ථික කටයුතුවලට අයත්වන හස්ත කර්මාන්ත අතර ප්‍රමුඛ ස්ථානයක් වේවැල් ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා ද හිමිවනු ලබයි. ඈත අතීතයේ පටන් පැවත එන වේවැල් ආශ්‍රිත නිෂ්පාදනයන් වර්තමානය වන විට නවීකරණය වන ලෝකයත් සමඟම ඉදිරියට ගොස් ඇත. සංවර්ධනය හා ගෝලීයකරණ සමඟ අත්වැල් බැදගත් වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත වර්තමානයේ දී විවිධ ධනාත්මක මෙන්ම ඍණාත්මක ප්‍රවණතාවයන් උද්ගත වී ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව බවට පත් වුයේ වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත සිදුව ඇති වර්තමාන ප්‍රවණතා මොනවාද යන්න සොයා බැලීමයි.

### 1.2 පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණය එක් ප්‍රධාන අරමුණක් හා උප අරමුණු දෙකක් ඔස්සේ සිදු කොට ඇත. පර්යේෂණය සිදු කිරීමේ මූලිකම අරමුණ වුයේ වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත වර්තමාන ප්‍රවණතා හඳුනා ගැනීමයි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙන් අනතුරුව එම ආර්ථික කටයුත්ත ස්ථාන ගත වීමට බලපාන හේතු හඳුනා ගැනීමත්, මෙම ආර්ථික කටයුත්ත ආශ්‍රිතව වර්තමානයේ පවතින ගැටළු හඳුනා ගැනීමත් පර්යේෂණයේ උප අරමුණ විය.

### 2.0 සාහිත්‍ය විමර්ශනය

වේවැල් භාණ්ඩ නිපදවන කුළු පොත්තන් පිළිබඳව රොබට් නොක්ස් සිය සටහන් අතර මෙලෙස සටහන් කොට ඇත.

***‘‘බෙරවායින් ළඟට එන්නෝ කුළු පොත්තෝය. ඔවුන්ගේ කාරිය වේවැල්, වේවැල් බටපොතු ආදියෙන් කුළු, කුඩා වට්ටි, පෙට්ටි ආදිය විවීමයි.......’’***

මේ අයුරින් රොබට් නොක්ස් ඔවුන්ගේ කර්මාන්තය පිළිබඳ කෙටි විස්තරයක් ද කර තිබේ. ඒ අනුව දහ හත්වැනි සියවසේ දී ද වේවැල් කර්මාන්තය ප්‍රබලව පැවැති බවත් රාජ අනුග්‍රහය ලබන්නට ඇති බවත් නිගමනය කළ හැකිය. එමෙන්ම අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ

වේවැල් කර්මාන්තය පැවති බව වේවැල්දූව, වේවැල් කඳුර, වේවැල්වල හා වේවැල්දෙණිය ආදී ග්‍රාම නාම වලින් මනාව ගම්‍යමාන වේ (ජයවර්ධන, 2015). වේවැල් කර්මාන්තයේ මෑත ඉතිහාසය සලකා බැලීමේ දී හැට හා හැත්තෑව දශක වඩාත් වේ. මන්ද එම කාලයේ අගමැතිනිය වී සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය වේවැල් කර්මාන්තයේ නියුක්ත වුවන්ට විවිධ වැඩ සටහන් සිදු කරමින් මෙම කර්මාන්තය නගා සිටුවීමට මහගු උත්සාහයක් දරා ඇත. ජාතික ශිල්ප සභාව හරහා මෙම කර්මාන්තය ජනතාව අතර ප්‍රචලිත කිරීමට එතුමිය විශාල උත්සාහයක් ගෙන ඇත (ජයවර්ධන, 2015).

මෙම නිෂ්පාදන සිදු කිරීමට යොදා ගන්නා මූලික අමුද්‍රව්‍ය "වේවැල්" යනුවෙන් පොදුවේ හැඳින්වුව ද මෙරට වේවැල් වර්ග විශාල ප්‍රමාණයක් ඇත. එනම්, සුදු වේවැල්, කම්බෝටු වේවැල්, හීන් වේවැල්, කෝර වේවැල් ,මා වේවැල්, නර වේවැල්, කැකුළු වේවැල්, එළ වේවැල්, තුඩරැල් ආදිය ඉන් කිහිපයකි (මුදලිගේ, 2017). මේ සියලුම වේවැල් එකම කටයුත්ත සඳහා භාවිතා නොකරන අතර එක් එක් භාණ්ඩ නිෂ්පාදනයට අදාලව යොදා ගන්නා වේවැල් වර්ගය ද වෙනස් වේ. පුටු සැකසීම වෙනුවෙන් බහුල භාවිත වන්නේ මාවැලයි. ගෙඩි වැල නමින් හැඳින් වූ හීනි වැල් විවීම් කටයුතු වෙනුවෙන් භාවිත කරයි. අතීතයේ අනෙක් වේවැල් වර්ග ද විවිධ කටයුතු වෙනුවෙන් භාවිතයට ගෙන තිබේ. පොදුවේ වේවැල් නිෂ්පාදනවල කල්පැවැත්ම තීරණය වෙන්නේ වේවැලෙහි සවි ශක්තිය අනුවය (බණ්ඩාරනායක, 2018). මෝරපු වේවැල් භාවිත කොට කරන නිෂ්පාදන අවුරුදු පහළොවක් විස්සක් කල් පවතින බව ද එසේම ළපටි වේවැල් වලින් කරන නිෂ්පාදන වැඩි කාලයක් නොපවතින බවද කර්මාන්තයේ නියුතු වුවන්ගේ අදහසයි.


## 3.0 ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය පිළිබඳව අවධානය යොමු කරන විට එය ප්‍රධාන කොටස් 05ක් යටතේ අධ්‍යයනය කළ හැකිය. එනම්, අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීම ,නියැදිය තෝරා ගැනීම, අවශ්‍ය දත්ත වර්ග හඳුනා ගැනීම ,දත්ත එක් රැස් කිරීම ,දත්ත විශ්ලේෂණය හා දත්ත ඉදිරිපත් කිරීම යි.

## 3.1 අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීම

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා අධ්‍යනය ප්‍රදේශය වශයෙන් තෝරා ගනු ලැබුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රදාවඩුන්න ග්‍රාම නිලධාරී වසමයි. මෙම අධ්‍යයනය සඳහා මෙම ප්‍රදේශය තෝරා ගැනීමට හේතු වුයේ ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම පැහැදිලිවම හඳුනා ගත හැකි ප්‍රධානතම කලාපයක් වීම නිසාවෙනි (බණ්ඩාරනායක, 2018). පහත රූප සටහන් අංක 01 හි දැක්වෙන්නේ අධ්‍යයනය ප්‍රදේශයේ පිහිටීමයි.

රූපසටහන 01: අධ්‍යයනය ප්‍රදේශයේ පිහිටීම




මූලාශ්‍රය: කර්තෘ නිර්මාණ

### 3.2 නියැදිය තෝරා ගැනීම

පර්යේෂණ සිදු කිරීම සඳහා නියැදිය වශයෙන් තෝරාගනු ලැබුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රදාවඩුන්න ග්‍රාම නිලධාරී වසමයි. එහි දී රදාවඩුන්න ග්‍රාම නිලධාරී වසමෙහි ජීවත් වන පවුල් අතුරින් වේවැල් නිෂ්පාදන සිදුකරන පවුල් 35 ක් අහඹු නියදීමේ ක්‍රමය යටතේ අධ්‍යයනය සඳහා නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී.

### 3.3 අවශ්‍ය දත්ත වර්ග හඳුනා ගැනීම

සංස්කෘතික පරිසර විද්‍යාත්මක ප්‍රවේශයකින් සිදු කරන මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ හා උප අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්තවල අවශ්‍යතාව මතුවිය.

### 3.4 දත්ත එක් රැස් කිරීම

ඒ අනුව අධ්‍යයනයට අවශ්‍යවන ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත ප්‍රාථමික හා ද්විතියික දත්ත රැස් කිරීමේ ක්‍රම මඟින් රැස් කර ගන්නා ලදී. මෙහි දී ප්‍රාථමික දත්ත ක්ෂේත්‍ර නිරීක්ෂණ, ව්‍යුහගත හා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා මඟින් ද ද්විතියික දත්ත පොත්පත්, සඟරා හා අන්තර්ජාලයෙහි ප්‍රකාශිත ලිපි ලේඛන මඟින් ද රැස් කර ගන්නා ලදී .

### 3.5 දත්ත විශ්ලේෂණය හා දත්ත ඉදිරිපත් කිරීම

රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කිරීමේ දී සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම (මධ්‍යනය, ප්‍රතිශත) හා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම භාවිතා කරන ලදී. එම ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කරන ලද දත්ත, වගු හා ප්‍රස්තාර මාධ්‍යයන්ගෙන් ඉරිපත් කරන ලදී.

## 4.0 දත්ත විශ්ලේෂණය

පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය කිරීමේ දී ප්‍රධාන වශයෙන් මූලික අරමුණ හා උප අරමුණු ද්විත්වයක් ඔස්සේ සිදුකරන ලදී. පහත දැක්වෙන්නේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණට ආදාලව සිදු කරනු ලැබූ දත්ත විශ්ලේෂණයයි.

### 4.1 වේවැල් නිෂ්පාදන වෙළදාම ආශ්‍රිත වර්තමාන ප්‍රවණතා හඳුනා ගැනීම

වේවැල් නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව සිදුව ඇති වර්තමාන ප්‍රවණතා අධ්‍යයනය කිරීමේ දී මතු සඳහන් ප්‍රවණතා හඳුනා ගැනීමට හැකි විය.

#### 4.1.1 නූතන දායකත්වය ඉතා මද බව

ක්ෂේත්‍ර නිරීක්ෂණයේ දී සිදු කරනු ලැබූ දත්ත රැස් කිරීමට අනුව නිෂ්පාදකයන් වේවැල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරනු ලැබූ කාලය පිළිබඳව විමසන විට මෙම කර්මාන්තයට නූතන දායකත්වයෙහි ඇති සීමිත බව මනාව පැහැදිලි වේ. පහත වගු අංක 01 හි දැක්වෙන්නේ වේවැල් භාණ්ඩ නිෂ්පාදකයන්ගේ සේවා නියුක්ති කාලය පිළිබඳවයි.

වගුව 01: වේවැල් භාණ්ඩ නිෂ්පාදකයන්ගේ සේවා නියුක්ති කාලය

| කාල සීමාව (අවුරුදු) | ප්‍රමාණය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 01ට අඩු | 0 | 0 |
| 01 - 05 අතර | 1 | 3 |
| 06 - 10 අතර | 3 | 9 |
| 10 වැඩි | 31 | 88 |
| එකතුව | 35 | 100 |

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණ 2019

මේ අනුව පෙනී යන්නේ මෙම කර්මාන්තය සිදු කරගෙන යාමට මෑත කාලීනව සිදුව ඇති දායකත්වය ඉතා අවම මට්ටමක පවතින බවයි. පසුගිය වසර 10ක පමණ කාලයක් තුළ මෙම කර්මාන්තයට එකතු වී ඇත්තේ නියැදියෙන් පුද්ගලයන් 4ක් පමණි. අනෙකුත් වේවැල් නිෂ්පාදකයන් 31 දෙනාම මෙම කර්මාන්තයට එක් වී ඇත්තේ මීට වසර 10කට පමණ ඉහතදීය. ඒ අනුව වර්තමානය වන විට මෙම කර්මාන්තයට ඇති නූතන දායකත්වය මඳ බව මනාව පැහැදිලි වේ.

### 4.1.2 නිෂ්පාදන විවිධාංගීකරණය වීම හා ආදේශක අමුද්‍රව්‍ය වලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම

වර්තමානය වන විට වේවැල් ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩවල විවිධාගීකරණයක් මෙන්ම ආදේශක අමුද්‍රව්‍ය වලින් භාන්ඩ නිෂ්පාදනය කිරීමත් දැකගත හැකි ප්‍රවණතාවයකි. අතීතයේ නිෂ්පාදනය කරනු ලැබූ සාම්ප්‍රදායික නිෂ්පාදන වෙනුවට නවීනත්වයට මුසු භාණ්ඩ නිෂ්පාදනයක් ක්ෂේත්‍ර නිරීක්ෂණවල දී දැක ගත හැකි විය. උදාහරණ,

- කුකුළු කූඩු
- මල් කූඩ
- විවිධ අලංකාර ආකෘති
- වෙඩින් කේක් අසුරන
- ලැම්ප් සෙට්
- බුමුතුරුණු
- සත්ව අනුරු (අලි, ඇතුන්, හංසයින්, මාළුවා, උකුස්සා)
- බිත්ති සැරසිලි
- නත්තල් පෙට්ටි

මෙලෙස නිෂ්පාදන විවිධාගීකරණය කිරීම නිසා මොවුන්ගේ ඉල්ලුම යම්තාක් දුරකට ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබී ඇති අතර විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ආශ්‍රිතව මෙම නිෂ්පාදන සඳහා හොඳ වෙළෙඳපලක් වර්තමානය වන විට නිර්මාණය වී ඇත. ඒ වගේම හෝටල් මඟින් බොහෝ විට වේවැල් නිෂ්පාදන ඇනවුම් කිරීමක් ද දැකගත හැකිය.

එමෙන්ම ආදේශක අමුද්‍රව්‍ය භාවිත කරමින් වේවැල් නිෂ්පාදනය කරන ස්ථානයන්වලදීම වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කිරීමක් සිදු කරනු ලබයි. එම අමුද්‍රව්‍ය අතර පන්, බට පතුරු, තල් කොළ, පොල් කොළ, පොල් කුරු, පොල් කටු, අමු රෙදි ආදිය පෙන්වා දිය හැකිය. මේවා භාවිතා කරමින් තොප්පි, අත් බෑග්, මල් පෝච්චි, බිත්ති සැරසිලි ආදිය නිෂ්පාදනය කරනු ලබයි. තවද වේවැල් නිෂ්පාදන අලෙවි කරන වෙළෙඳසැල්වලම ප්ලාස්ටික් හා ඇලුමිනියම් නිෂ්පාදන අලෙවි කිරීමක් ද ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී දැක ගැනීමට හැකි විය.

### 4.1.3 නිෂ්පාදන මිල ඉහළයාමත් සමඟ මිලදී ගන්නා ප්‍රමාණය අඩු වීම

වර්තමානය වන විට වේවැල් ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩවල මිල සීග්‍රයෙන් ඉහළ යමින් පවතී. එයට ප්‍රධාන වශයෙන් හේතු කිහිපයක් බලපා ඇත. එනම්, අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතාවය, ප්‍රවාහන වියදම් ඉහළයාම හා ප්‍රවාහන බලපත්‍ර ලබා ගැනීමට සිදු වීම යනාදියයි. එමෙන්ම මුල් කාලීනව මේවා මිටි වශයෙන් වෙළෙඳපලට ලබා දුන්න ද වර්තමානයේ කිලෝ ගණන් වලින් විකුණනු ලබයි. එම නිසා අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී විශාල

මුදලක් වැය කිරීමට සිදු වේ. එම හේතු සාධකවල බලපෑමත් නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යෑමෙන් නිෂ්පාදනවල විකුණුම් මිල ඉහළ ගොස් ඇත. මේ නිසාම නිෂ්පාදනවල අඩුවක් දැකගත හැකි වේ. ඒ අනුව අධ්‍යයනයේ නියැදියෙන් 77%ක ප්‍රමාණයකගේ මාසික ආදායම රු. 25,000 වඩා අඩු බව හඳුනා ගැනීමට හැකි විය. ඒ අනුව වර්තමානය වන විට මෙම නිෂ්පාදන කර්මාන්තයේ යම් පසුබෑමේ ස්වභාවයක් දැකගත හැකි වේ.

වෙළඳසැල් සඳහා විලක්ප ස්ථාන නොමැති වීම, කර්මාන්තකරුවන් සඳහා දිරිගැන්මක් නොමැති වීම, පාරම්පරික කර්මාන්තකරුවන් වයස්ගත් වීම නිසා පළපුරුදු සේවකයන් නොමැති වීම, ඉල්ලුම අඩු වීම, ලැබෙන ලාභය අවම වීම, මෙම ප්‍රදේශයේ නිෂ්පාදන වෙනත් ප්‍රදේශවලට තොග වශයෙන් ලබා දීම, තවද ආදේශක භාණ්ඩ මෙම ප්‍රදේශයේ පැවතීම විශාල ලෙස මේ සඳහා හේතු වී ඇත. එමෙන්ම ප්ලාස්ටික් ආදේශක වෙළඳපලට පැමිණීම, වේවැල් නිෂ්පාදනවල කල් පැවැත්ම අඩු වීම, මෙම ප්‍රදේශයේ ආර්ථික කටයුතු පසු බැසීමට හේතු ලෙස හඳුනා ගත හැකිවේ. ඒ අනුව කාලීනව මෙම ආර්ථික කටයුත්තෙහි පසු බැසීමක් දක්නට ලැබේ. ඒ වගේම අධ්‍යයනයේ දී දත්ත විමසීමට අනුව නියැදියෙන් 28 දෙනෙක් එනම් 80% ක ප්‍රමාණයක් ප්‍රකාශ කරනු ලැබුවේ මෙම නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව පසුබෑමේ ස්වභාවයක් පවතින බවයි.

මතු දක්වා ඇත්තේ අධ්‍යයනයේ උප අරමුණු ද්විත්වයට අදාලව සිදු කරනු ලැබූ දත්ත විශ්ලේෂණයයි.

### 04.2 ආර්ථික කටයුත්ත ස්ථාන ගත වීමට බලපාන හේතු හඳුනා ගැනීම

මෙම ආර්ථික කටයුත්ත මෙම ප්‍රදේශයේ ස්ථාන ගත වීමට බලපාන ලද කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී නියැදියෙහි අදහස පහත වගු අංක 02හි දක්වා ඇත.

වගුව 02: ආර්ථික කටයුත්ත ස්ථාන ගත වීමට බලපාන හේතු

| ස්ථානගත වීමට බලපෑ හේතුව | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව | 03 | 06% |
| පාරම්පරික නිෂ්පාදන හිමිකමක් පැවතීම | 26 | 55% |
| ප්‍රවේශතා/ ප්‍රවාහන පහසුකම් | 09 | 19% |
| භූමිය ලාභදායී වීම | 04 | 09% |
| ද්‍රව්‍යතා දර්ශකයට අනුව වෙළඳපොල හෝ අමුද්‍රව්‍ය පිහිටි ස්ථානයේ වෙළඳසැල් පිහිටා තිබීම | 05 | 11% |
| **එකතුව** | **35** | **100%** |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2019

ඉහත වගු අංක 02ට අනුව වැඩිම පිරිසක් එම ප්‍රදේශයේ මෙම නිෂ්පාදන සිදු කිරීමට හේතු වී ඇත්තේ පාරම්පරික නිෂ්පාදන හිමිකමක් පැවතීමයි. එනම් මුලු නියැදියෙන් 55%ක අගයක් වාර්තා කරමිනි. දෙවනුවට වැඩිම පිරිසක් මෙම වේවැල් නිෂ්පාදන සිදු කිරීමට හේතු වී

ඇත්තේ, ප්‍රවාහන පහසුකමයි. එහිදී වෙළඳපොල කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගය ආසන්නව පිහිටා තිබීම නිසා වෙළඳපොළට ප්‍රවේශ වීමේ පහසුවත්, අමුද්‍රව්‍ය හා නිෂ්පාදන පහසුවෙන් වෙළඳසැල් වෙත ළඟා කර ගැනීමට හැකි වීමත් මූලික වේ.

### 04.3 මෙම ආර්ථික කටයුත්ත ආශ්‍රිතව වර්තමානයේ පවතින ගැටළු හඳුනා ගැනීම

අධ්‍යයනයේ රැස් කළ දත්ත විශ්ලේෂණයට අනුව මතු සඳහන් මෙම නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව දැකගත හැකි වේ.

#### 04.3.1 අමුද්‍රව්‍ය හිඟ වීම

අතීතයේ ප්‍රදේශයේ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය එම ප්‍රදේශයෙන්ම සොයා ගැනීමට හැකි වූ අතර වර්තමානය වන විට මෙම ප්‍රදේශයේ වේවැල් අමුද්‍රව්‍ය හිඟ වීම නිසා පොළොන්නරුව, මහියංගයනය, බිබිල, අනුරාධපුර, මඩකලපුව, හසලක, එරාවූර් හා අම්පාර වැනි ප්‍රදේශවලින් වේවැල් ආනයනය කිරීමට සිදුව ඇත.

#### 04.3.2 අමුද්‍රව්‍ය ප්‍රවාහනයට විශාල මුදලක් වැය වීම

රදාවඩුන්න ප්‍රදේශයේ හා ඒ අවට කලාපයේ අමුද්‍රව්‍ය නොමැති වීම නිසා වෙනත් ප්‍රදේශවලින් අමුද්‍රව්‍ය ප්‍රවාහනයන කිරීමට සිදුවීම නිසාම ප්‍රවාහන වියදම් ඉහළ ගොස් ඇති අතර එහි ප්‍රථිඵලයක් ලෙස නිෂ්පාදන පිරිවැයද ඉහළ ගොස් ඇත.

#### 04.3.3 වේවැල් ප්‍රවාහනයේ දී බලපත්‍ර ලබා ගැනීමට සිදු වීම

වේවැල් ප්‍රවාහන කිරීමට බලපත්‍ර ලබා ගැනීමට සිදුව ඇති බව ක්ෂේත්‍ර නිරීක්ෂණ වලදී වේවැල් භාණ්ඩ නිෂ්පාදකයන් හා වෙළඳසැල් හිමියන් ප්‍රකාශ කරන ලදී. එලෙස බලපත්‍ර ලබා ගැනීමට අමතර කාලයක් හා මුදලක් වැය කිරීමට සිදු වීම නිෂ්පාදකයන් පීඩාවට පත් කරනු ලබන ගැටළුවක් ලෙස හඳුනාගත හැකි විය.

#### 04.3.4 පාරම්පරික කර්මාන්තකරුවන් වයස්ගත වීම නිසා පළපුරුදු සේවකයන් නොමැති වීම

සාම්ප්‍රදායිකව වේවැල් කර්මාන්තයේ නියුක්තවූවන් වර්තමානයේ දී මෙම කර්මාන්තයේ නියැලීමට මැලිකමක් දක්වන අතර ඒ නිසාම වර්තමානයේ දී වේවැල් නිෂ්පාදන සිදු කර ගෙන යාම සඳහා ප්‍රදේශයේ පලපුරුදු ශ්‍රමිකයන්ගේ ඌණතාවක් උද්ගතව ඇත.

#### 04.3.5 නව පරපුර මෙම කර්මාන්තයට අඩු නැඹුරුවක් දැක්වීම

මෙම නිෂ්පාදන සිදු කරන පවුල්වල දරුවන් මෙම කර්මාන්තයේ නියැලීමට මැලි කමක් දැක්වීමට ප්‍රධාන වශයෙන් හේතු කිහිපයක් බලපා ඇත. එනම්, නිසි වෙළඳපොළක් නොමැති වීම, අමුද්‍රව්‍ය හිඟය හා සංස්කෘතිකමය වශයෙන් මෙම නිෂ්පාදනකරුවන් සමාජයේ පහත් යැයි සැලකීම ඉන් ප්‍රමුඛ වන බව අධ්‍යනයේ දී හඳුනා ගැනීමට හැකි විය.

### 04.3.6 විදේශීය ආදේශක භාණ්ඩ වර්ග වෙළඳපොළට පැමිණීම

චීනය, ඉන්දියාව වැනි රටවල් වලින් ආනයනය කරන පන්, ඉරටු, තල් කොළ, බට පතුරු, තල් ගොබ ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළට පැමිණීමත් විදේශීය ආදේශක භාණ්ඩවල මිල වේවැල් භාණ්ඩ වලට වඩා අඩු වීම හා විදේශීය නිෂ්පාදන ආකර්ශනීය බවින් යුක්ත වීම නිසා වේවැල් නිෂ්පාදනවල විකුණුම් ධාරිතාවයට බලපෑමක් එල්ල කිරීමට විදේශීය ආදේශක භාණ්ඩවලට හැකියාව ලැබී ඇත.

දත්ත විශ්ලේෂණය අවසානයේදී ශදුඅත විශ්ලේෂණයක් (SWOT Analysis) සිදු කරන ලදී. ඒ අනුව පහත වගු අංක 03 හි දක්වා ඇති ශක්‍යතා (Strength) දුර්වලතා (Weakness) අවස්ථා (Oportunities) හා තර්ජන (Threats) හඳුනා ගැනීමට හැකි විය.

වගුව 03: ශදුඅත විශ්ලේෂණය

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| ❖ භූමිය ලාභදායී වීම | ❖ අමුද්‍රව්‍ය හිඟය |
| ❖ පුහුණු ශ්‍රමය පැවතීම | ❖ නිෂ්පාදන මිල ඉහළයාමත් සමග මිලදී ගන්නා ප්‍රමාණය අඩු වීම |
| ❖ පාරම්පරික නිෂ්පාදන හිමිකමක් පැවතීම | ❖ නිෂ්පාදකයන් නිෂ්පාදනයන් ගෙන් ඉවත් වීම |
| ❖ නිෂ්පාදන විවිධාංගීකරණය වීම | ❖ වේවැල් ප්‍රවාහනයේ දී බලපත්‍ර ලබා ගැනීමට සිදු වීම |
| ❖ වෙළඳපොළට ප්‍රවේශ වීමේ පහසුව | ❖ නව පරපුර මෙම කර්මාන්තයට අඩු නැඹුරුවක් දැක්වීම |
| | ❖ වෙළඳසැල් සඳහා විලක්ප ස්ථාන නොමැති වීම |
| | ❖ ලාභය අවම වීම |
| | ❖ සංස්කෘතිකමය වශයෙන් මෙම නිෂ්පාදනකරුවන් සමාජයේ පහත් යැයි සැලකීම |
| **අවස්ථා** | **තර්ජන** |
| ❖ විදේශීයකයන් අතර හොඳ වෙළඳපොලක් පැවතීම | ❖ විදේශීය ආදේශක භාණ්ඩ වර්ග වෙළඳපොළට පැමිණීම |

| | |
|---|---|
| ❖ දේශීය වශයෙන් වේවැල් නිෂ්පාදන සඳහා පවතින ඉල්ලුම වර්ධනය වීම | ❖ පාරම්පරික කර්මාන්තකරුවන් වයස්ගත වීම නිසා පළපුරුදු සේවකයන් නොමැති වීම |
| ❖ ප්‍රවේශතා/ ප්‍රවාහන පහසුකම් | ❖ නූතන දායකත්වය ඉතා මඳ බව |
| ❖ ද්‍රව්‍යතා දර්ශකයට අනුව වෙළඳපොල හෝ අමුද්‍රව්‍ය පිහිටි ස්ථානයේ වෙළඳසැල් පිහිටා තිබීම | ❖ අමුද්‍රව්‍ය ප්‍රවාහනයට විශාල මුදලක් වැය වීම |
| ❖ මෙම ප්‍රදේශයේ නිෂ්පාදන වෙනත් ප්‍රදේශවලට තොග වශයෙන් ලබා දීම | ❖ කර්මාන්තකරුවන් සඳහා දිරිගැන්මක් නොමැති වීම |
| ❖ අමුද්‍රව්‍ය හා නිෂ්පාදන පහසුවෙන් වෙළඳසැල් වෙත ළගා කර ගැනීමට හැකි වීම | ❖ කාලීනව මෙම ආර්ථික කටයුත්තෙහි පසු බැසීමක් දක්නට ලැබීම |
| | ❖ නිසි වෙළඳපොළක් නොමැති වීම |
| | ❖ විදේශීය නිෂ්පාදන ආකර්ශනීය බවින් යුක්ත වීම |
| | ❖ ආදේශක අමුද්‍රව්‍ය වලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම |

මුලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2019

## 5.0 නිගමන හා යෝජනා

වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත වර්තමාන ප්‍රවණතා පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණ හා උප අරමුණු ද්විත්වයක් ඔස්සේ දත්ත විශ්ලේෂණය කොට ඇත. මෙම පර්යේෂණය සිදු කිරීමේ ප්‍රධාන අරමුණ වුයේ වේවැල් නිෂ්පාදන වෙළෙඳාම ආශ්‍රිතව වර්තමානයේ සිදුව ඇති ප්‍රවණතා හඳුනා ගැනීමයි. ඒ අනුව අධ්‍යයනය අවසානයේ දී වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිතව වර්තමාන ප්‍රවණතා රැසක් හඳුනා ගැනීමට හැකි විය. ඒවා නම් ,නූතන දායකත්වය ඉතා මඳ බව ,නිෂ්පාදන විවිධාංගීකරණය වීම හා ආදේශක අමුද්‍රව්‍ය වලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම ,නිෂ්පාදන මිල ඉහළයාමත් සමඟ මිලදී ගන්නා ප්‍රමාණය අඩු වීම ,වර්තමානය වන විට පසුබෑමේ ස්වභාවයක් දැකගත හැකි වීම , ආදේශක භාණ්ඩ වර්ග වෙළඳපොළට පැමිණීම යනාදිය හඳුනා ගත හැකි විය. ඒ අනුව මෙම ප්‍රවණතා ධනාත්මක ප්‍රවණතා මෙන්ම ඍණාත්මක ප්‍රවණතා වශයෙන් ද හඳුනා ගැනීමට හැකි විය.

අධ්‍යයනයෙහි උප අරමුණු ද්විත්වයෙන් පළමු වැන්න වුයේ මෙම නිෂ්පාදන ආර්ථික කටයුත්ත ස්ථාන ගත වීමට බලපාන හේතු හඳුනා ගැනීමයි. ඒ අනුව වේවැල් කර්මාන්තය මෙම ප්‍රදේශයේ ස්ථාන ගත වීමට බලපෑ ප්‍රධාන හේතු සාධක කිහිපයක් අධ්‍යයනය අවසානයේ දී හඳුනා ගැනීමට හැකිවිය. එනම් ,අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව ,පාරම්පරික නිෂ්පාදන හිමිකමක් පැවතීම ,ප්‍රවේශතා/ප්‍රවාහන පහසුකම් ,භූමිය ලාභදායී වීම ,ද්‍රව්‍යතා

දර්ශකයට අනුව වෙළඳපොල හෝ අමුද්‍රව්‍ය පිහිටි ස්ථානයේ වෙළඳසැල් පිහිටා තිබීම යනාදියයි.

අධ්‍යයනය සිදු කිරීමේ අනෙක් උප අරමුණ වුයේ මෙම ආර්ථික කටයුත්ත ආශ්‍රිතව වර්තමානයේ පවතින ගැටළු හඳුනා ගැනීමයි .එම අරමුණට අදාළ දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව නිගමනය කළ හැකි වුයේ මෙම කර්මාන්තය ආශ්‍රිතව ගැටළු රාශියක් පවතින බවය. ඒවානම්, අමුද්‍රව්‍ය හිග වීම, අමුද්‍රව්‍ය ප්‍රවාහනයට විශාල මුදලක් වැය කිරීමට සිදුවීම ,වේවැල් ප්‍රවාහනයේ දී බලපත්‍ර ලබා ගැනීමට සිදු වීම ,පාරම්පරික කර්මාන්තකරුවන් වයස්ගත වීම නිසා පළපුරුදු සේවකයන් නොමැති වීම ,නව පරපුර මෙම කර්මාන්තයට අඩු නැඹුරුවක් දැක්වීම යනාදියයි.

වේවැල් නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව උද්ගත වී ඇති විවිධ ගැටළු මග හරවා ගැනීම සඳහා ඉරිදිපත් කළ හැකි යෝජනා කිහිපයකි. එනම්, රාජ්‍ය අනුග්‍රහය ලබා දීම, ප්‍රවාහන බලපත්‍රවල අයකිරීම් නිෂ්පාදකයන්ට දරා ගත හැකි මට්ටමට අඩු කර ගැනීම, නිෂ්පාදකයන් හට ණය පහසුකම් ලබා දීම, වෙළඳාම් දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය ව්‍යාපාරික දැනුම ලබා දීම, නව භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය දැනුම ලබා දීම, විදෙස් රටවලින් නව නිර්මාණකරණය පිළිබඳව නිෂ්පාදකයන් දැනුවත් කිරීම, දේශීය හා විදේශීය වෙළඳපොලට ඇති ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීම ආදිය පෙන්වා දිය හැකිය. අවසානයේදී මෙම කර්මාන්තය ආශ්‍රිත පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන ශඳුවත විශ්ලේෂණය මගින් හඳුනා ගන්නා ලදී. මෙම නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව සිදු කළ හැකි වෙනත් පර්යේෂණය ලෙස වේවැල් නිෂ්පාදන ආශ්‍රිතව සිදු වී ඇති ශ්‍රම විචලන පිළිබඳ අධ්‍යයනය කිරීම හා වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත වර්තමාන ප්‍රවණතා ඇතිවීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යනයක් ඉදිරියෙදී පර්යේෂකයන් සඳහා යෝජනා ලෙස ඉදිරිපත් කෙරෙනු ඇත.

**මූලාශ්‍ර**

ජයවර්ධන, එම්. සී. එන්. (2015). වේවැල් කර්මාන්තය හා බැඳුනු ජන ජීවිතය පිළිබඳව අධ්‍යයනයක්. *සරසවි ලේඛා*, කැලණිය විශ්වවිද්‍යාලය

බණ්ඩාරනායක, එන්. (2018, ඔක්තෝබර් 08). වේවැල් පාර වැදෙද්දිත් වේවැල් එක්ක ඔට්ටු වෙන වේවැල්දෙණියේ මිනිස්සු, *රැස*

මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, (2018). *සම්පත් පැතිකඩ*, මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මීරිගම

ලංකා නිව්ස්, (2018). එල්ලෙන්න වැල් සොයන වේවැල් කර්මාන්තකරුවෝ. උපුටා ගන්නා ලද්දේ https://lankanewsweb.net/sinhala/%E0%B6%B4%E0%B7%94%E0%B7%80%E0%B6%AD%E0%B7%8A/127-general-news/27954-14131-2018-03-30-07-58-48

මුදලිගේ, එම්. (2017). *වැලේ වැල් ඇති මේ වැල් වේ වැල්*. දිනමිණ.